# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2291/07 - 2022 අගෝස්තු මස 01 වැනි සඳුදා - 2022.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අගෝස්තු මස 01 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
සුහුරුපාය,
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නුවරඑළිය මහ නගර සභාව හා නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීම.**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද නුවරඑළිය මහ නගර සභාව හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් අන්තර්ගත වන්නා වූ, නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2022 ක් වූ අගෝස්තු මස 01 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, උක්ත පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අගෝස්තු මස 01 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
සුහුරුපාය,
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

---

**නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 11 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

මේජර් ජනරාල් (විශ්‍රාමික) **උදය නානායක්කාර,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2022 අගෝස්තු මස 01 වැනි දින.

EOG 08 - 0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.